සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

**10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

උපදෙස් :

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල ( × ) ලකුණ යොදන්න.

---

- විශ්ව විද්‍යාලයට ඇතුළත්වීමේ බලාපොරොත්තුවෙන් සිටින පවනි ප්‍රදේශයේ පාසල් දරුවන් සඳහා ඉංග්‍රීසි උපකාරක පන්ති පවත්වයි.

01. ඉහත සිද්ධියේ සඳහන් මිනිස් අවශ්‍යතාවක් හා වුවමනාවක් පිළිවෙලින් දැක්වෙන්නේ,
(i) අධ්‍යාපනය , උපකාරක පන්ති (ii) උපකාරක පන්ති , අධ්‍යාපනය
(iii) විශ්ව විද්‍යාලය , අධ්‍යාපනය (iv) නිවාස , අධ්‍යාපනය

02. අවශ්‍යතා හා වුවමනා අතර වෙනස දැක්වෙන්නේ,
(i) අවශ්‍යතා අසීමිතයි , වුවමනා සීමිතයි (ii) වුවමනා පොදුයි , අවශ්‍යතා විවිධයි
(iii) අවශ්‍යතා සරලයි , වුවමනා සංකීර්ණයි (iv) වුවමනා විවිධයි , අවශ්‍යතා සංකීර්ණයි

03. මිනිස් අවශ්‍යතාවල ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) සරලයි , විවිධයි (ii) සරලයි , පොදුය (iii) පොදුයි , සංකීර්ණයි (iv) සීමිතයි , විවිධයි

04. භූමිය නැමැති නිෂ්පාදන සාධකයට ①....... අයත්වන අතර ප්‍රාග්ධනය නැමැති නිෂ්පාදන සාධකයට ②..... අයත් වේ.
ඉහත ප්‍රකාශයේ ① හා ② යන ස්ථාන වලට අදාළ නිවැරදි පිළිතුර පිළිවෙලින් දැක්වෙන්නේ,
(i) ඛණිජ සම්පත් , වන සම්පත් (ii) පස , ගොඩනැගිලි
(iii) ගොඩනැගිලි , ඛණිජ සම්පත් (iv) වන සම්පත් , පස

**පහත සිද්ධිය ඇසුරින් 05, 06, 07 යන ප්‍රශ්නවලට පිළිතුර සපයන්න.**

සදුනි තිලකරත්න විසින් " සඳු බෑග් සෙන්ටර් " නමින් ප්‍රදේශයේ බහුලව පවතින විවිධ පන් වර්ග භාවිතා කොට පන් ආශ්‍රිත විසිතුරු බෑග් නිෂ්පාදනයේ නිරත වේ.

05. " සඳු බෑග් සෙන්ටර්" හි ඇල්මැති පාර්ශවයක් නොවන්නේ,
(i) ප්‍රදේශයේ කාර්යාල සේවිකාවන් (ii) ව්‍යාපාරයේ සේවිකාවන්
(iii) අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් (iv) ප්‍රදේශයේ සපත්තු නිෂ්පාදකයින්

06. සඳු බෑග් සෙන්ටර් හි ඇල්මැති පාර්ශවයක් වන සදුනි තිලකරත්නගේ ප්‍රධාන අරමුණකි.
(i) රැකියා වර්ධනය (ii) සාධාරණ වැටුප් ලබා ගැනීම.
(iii) ව්‍යාපාරයේ අනාගත වර්ධනය (iv) රැකියා තෘප්තිය

07. ඉහත ව්‍යාපාරය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(i) සඳු බෑග් සෙන්ටර් සේවා සැපයීමේ ව්‍යාපාරයකි.
(ii) සඳු බෑග් සෙන්ටර් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
(iii) සඳු බෑග් සෙන්ටර් සුභ සාධන අරමුණින් කරන ව්‍යාපාරයකි.
(iv) සඳු බෑග් සෙන්ටර් පොදු අංශයේ ව්‍යාපාරයකි.

08. සේවා නිෂ්පාදන ව්‍යාපාර පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) චොක්ලට් නිෂ්පාදන ආයතන , දත් බෙහෙත් නිෂ්පාදන ආයතන
(ii) තොග වෙළඳ ආයතන , සබන් නිෂ්පාදන ආයතන
(iii) බැංකු ආයතන , රක්ෂණ ආයතන
(iv) අධ්‍යාපන ආයතන , චොක්ලට් නිෂ්පාදන ආයතන

09. පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) කය වෙහෙසා වැඩ කරන පුද්ගලයින් පමණක් ශ්‍රමයට අයත් වේ.

(ii) නිෂ්පාදනයට අවශ්‍ය භූමිය ශ්‍රමය ප්‍රාග්ධනය වැනි නිෂ්පාදන සාධක සංවිධානය කර නිෂ්පාදන ක්‍රියාවලියක් කරගෙන යන්නා කළමණාකරු වේ.

(iii) නිෂ්පාදනයේ දී ආධාර කරගන්නා මිනිසා විසින් සකස් කරන ලද දෑ ව්‍යවසාය නම් වේ.

(iv) ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු සම්පත් භූමිය යනුවෙන් හැඳින්වේ.

10. ව්‍යාපාරිකයෙකුට පාලනය කළ නොහැකි පරිසරය හඳුන්වන්නේ,

(i) අභ්‍යන්තර පරිසරය ලෙසය. (ii) ව්‍යාපාර පරිසරය ලෙසය.

(iii) ක්ෂුද්‍ර පරිසරය ලෙසය. (iv) බාහිර පරිසරය ලෙසය.

11. ව්‍යාපාර පරිසර සාධක කීපයක් පහත දැක්වේ.

A ගනුදෙනුකරුවෝ

B සැපයුම්කරුවෝ

C කළමණාකරුවෝ

D සේවකයෝ

E දේශපාලන පරිසරය

මේවායින් බාහිර පරිසරයට පමණක් අයත් සාධක සහිත පිළිතුර වන්නේ,

(i) ABE (ii) ABD (iii) ACD (iv) BDE

12. සේනපුර ප්‍රදේශයේ ජීවත් වන ලක්ෂාන් ඔහුගේ සොයුරියන් දෙදෙනා සමග එක්වී දේශීය අමුද්‍රව්‍ය භාවිතා කර සුළු පරිමාණ ව්‍යාපාරයක් ඇරඹීය. රජය ඔවුන්ගේ ව්‍යාපාරය දිරිගන්වමින් ගුණාත්මක අමුද්‍රව්‍ය ලබාගැනීමට පහසුකම් සලසා දී ඇත.

ඉහත සිද්ධියේ රජය ලබාදෙන දිරිගැන්වීම අයත් වන්නේ,

(i) ගෝලීය පරිසරයටය. (ii) තාක්ෂණික පරිසරයටය.

(iii) ආර්ථික පරිසරයටය. (iv) දේශපාලන පරිසරයටය.

13. ගෝලීය පරිසරය නිසා අත්වන වාසියකි.

(i) විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම. (ii) දැඩි තරගකාරීත්වය.

(iii) පුහුණු ශ්‍රමය විදේශවලට ඇදීයාම. (iv) ගුණාත්මක දේශීය අමුද්‍රව්‍ය ලබා ගත හැකි වීම.

14. ආර්ථික පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(i) ආදායම් ව්‍යාප්තිය , අයවැය ප්‍රතිපත්තිය. (ii) අයවැය ප්‍රතිපත්ති , යටිතල පහසුකම්

(iii) පරිසර සංරක්ෂණ අනපනත් , අයවැය ප්‍රතිපත්ති (iv) ජාත්‍යන්තර සබඳතා , ඉතුරුම්

15. පහත දැක්වෙනුයේ හිමිකාරිත්වය අනුව වර්ග කරන ලද ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයකි.

A ඒකපුද්ගල ව්‍යාපාර

B රාජ්‍ය දෙපාර්තමේන්තු

C සමූපකාර සමිති

D රාජ්‍ය සමාගම්

E සංස්ථාපිත සමාගම්

මේවා අතරින් පෞද්ගලික අංශයේ ව්‍යාපාර පමණක් ඇතුලත් වනුයේ,

(i) A,B,D (ii) A,C,E (iii) B,C,E (iv) C,D,E

16. සංස්ථාපිත සමාගමක වාසි පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

(i) අඛණ්ඩ පැවැත්මක් පැවතීම , වගකීම අසීමිත වීම , නෛතික පුද්ගලභාවයක් පැවතීම.

(ii) අඛණ්ඩ පැවැත්මක් පැවතීම , වගකීම සීමා සහිත වීම , නෛතික පුද්ගලභාවයක් පැවතීම.

(iii) අඛණ්ඩ පැවැත්මක් නොපැවතීම , වගකීම අසීමිත වීම , නෛතික පුද්ගල භාවයක් පැවතීම.

(iv) අඛණ්ඩ පැවැත්මක් නොපැවතීම , වගකීම සීමා සහිත වීම , නෛතික පුද්ගල භාවයක් නොමැති වීම.

17. අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන මුළුමනින්ම රජයේ ඍජු පාලනයට අයත්වන ආයතන,

(i) රාජ්‍ය සංස්ථා ලෙස හැඳින්වේ.

(ii) සමූපකාර සමිති ලෙස හැඳින්වේ.

(iii) රාජ්‍ය සමාගම් ලෙස හැඳින් වේ.

(iv) රාජ්‍ය දෙපාර්තමේන්තු ලෙස හැඳින්වේ.

- පහත ප්‍රකාශය ඇසුරින් ප්‍රශ්න අංක 18 සහ 19 ට පිළිතුරු සපයන්න.

සුනිමල් විසින් " සුමිහිරි පැන් " නමින් පළතුරු බීම අලෙවි සැලක් තම පෞද්ගලික ධනය යොදා ආරම්භ කිරීමට අදහස් කරයි. නමුත් ඔහුට ව්‍යාපාරය පිළිබඳ දැනුම හා පළපුරුද්ද ඉතා අඩු බැවින් ඔහුගේ පාසල් මිතුරෙකු වූ මිහිරි තම ව්‍යාපාරයට සම්බන්ධ කරගැනීමට සුනිමල් අදහස් කරයි.

18. සුනිමල් විසින් තෝරා ගත යුතු වඩාත් සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?

(i) ඒක පුද්ගල ව්‍යාපාර (ii) සමූපකාර සමිති (iii) හවුල් ව්‍යාපාර (iv)සංස්ථාපිත සමාගම්

19. ඉහත ව්‍යාපාරයේ ලියාපදිංචිය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ,

(i) ව්‍යාපාරය සමාගම් පනත යටතේ ලියාපදිංචිය අනිවාර්ය වේ.

(ii) ව්‍යාපාර නාමය ලියාපදිංචිය අනිවාර්ය වේ.

(iii) ව්‍යාපාරය සමූපකාර දෙපාර්තුමේන්තුවේ ලියාපදිංචි කළ යුතුවේ.

(iv) ව්‍යාපාරය හෝ ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.

20. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සඳහා අදාළ අයදුම්පත ලබා ගත යුත්තේ,

(i) ග්‍රාම නිළධාරී කාර්යාලයෙනි. (ii) පළාත් සභා කාර්යාලයෙනි.

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනි. (iv) සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙනි.

21. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී සලකනු ලබන නිර්ණායකයක් **<u>නොවන්නේ</u>** ,

(i) ව්‍යාපාරයේ ප්‍රාග්ධන ප්‍රමාණය (ii) සේවක සංඛ්‍යාව

(iii) භාවිතා කරන බලශක්ති ප්‍රමාණය (iv) ව්‍යාපාරයේ ලාභ අරමුණ

22. ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ වනුයේ,

(i) ගිණුම් කාලච්ඡේදය අවසානයේ මූල්‍ය ප්‍රකාශ සැකසීම යි.

(ii) ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව සඳහා අවශ්‍ය විවිධ තොරතුරු සැපයීම යි.

(iii) අධ්‍යක්ෂකවරුන්ට හෝ කළමණාකරුවන්ට අවශ්‍ය තොරතුරු සැපයීම යි.

(iv) ආයෝජන තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු සැපයීම යි.

23. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අනාගතයේ දී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා එන්නා වූ ව්‍යාපාරය විසින් පාලනය කෙරෙන සම්පත් .......................... ලෙස හඳුන්වනු ලැබේ.

(i) වගකීම් (ii) වත්කම් (iii) වියදම් (iv) ආදායම්

24. පහත X තීරුවේ ගිණුම් වර්ගයද Y තීරුවේ එම ගිණුම් වල සටහන් කරන අයිතම ද දක්වේ.

| | X තීරුව | | Y තීරුව |
|---|---|---|---|
| i. | වත්කම් ගිණුම් | A - | විකුණුම් |
| ii. | වගකීම් ගිණුම් | B - | ගෙවූ කොමිස් |
| iii. | හිමිකම් ගිණුම් | C - | බැංකු ණය |
| iv. | ආදායම් ගිණුම් | D - | ණයගැතියෝ |
| v. | වියදම් ගිණුම් | E - | ප්‍රාග්ධනය |

X තීරුවේ ගිණුම් වර්ගය Y තීරුවේ සඳහන් අයිතම සමඟ අනුපිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර වනුයේ,

(i) A, C, D, B, E (ii) C, A, B, E, D (iii) D, C, E, A, B (iv) D, B, C, A, E

25. ව්‍යාපාරයක වත්කම් සහ හිමිකම් වැඩි වීමට බලපාන ගනුදෙනුවක් වන්නේ,

(i) අයිතිකරු විසින් රු. 100,000 ක අමතර ප්‍රාග්ධනය යෙදීම.

(ii) අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනයට රු. 5000 ක් ගැනීම.

(iii) ව්‍යාපාරයේ විදුලි බිල රු. 2000 ක් ගෙවීම.

(iv) ණයගැතියෙකුගෙන් රු.5000 ක් ලැබීම.

**පහත තොරතුරු ඇසුරින් 26, 27, 28 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ජීවන්ගේ ව්‍යාපාරයේ 2018 මැයි මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A - රු. 50 000 ක් පිරිවැය වූ භාණ්ඩ මිලට ගැනීම.

B - මාසික කඩ කුලී ලෙස රු. 5000 ක් ගෙවීම.

C - රු. 100 000 ක බැංකු ණයක් ලබා ගැනීම.

D - රු. 10 000 ක භාණ්ඩ තොගයක් රු. 15 000 කට ණයට විකිණීම.

E - සේවක වැටුප් රු. 5 000 ක් ගෙවීම.

26. ඉහත ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ වගකීම් වැඩි වීමට බලපාන ගනුදෙනුවක් වනුයේ,

(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

27. ඉහත ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ වියදම් වනුයේ,

(i) A හා B ය. (ii) B හා D ය. (iii) C හා E ය. (iv) B හා E ය.

28. ඉහත D ගනුදෙනුව ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය නිවැරදිව දක්වනුයේ,

| | මුදල් | + | තොගය | + | ණයගැතියෝ | = | වගකීම් + හිමිකම |
|---|---|---|---|---|---|---|---|
| 1. | (10 000 ) | | | | +5000 | = | ( 5000 ) |
| 2. | | | ( 10 000 ) | | +15 000 | = | +5000 |
| 3. | | | +10 000 | | +15 000 | = | +5000 |
| 4. | +15 000 | | | | ( 10 000 ) | = | +5000 |

29. වත්කම් = හිමිකම් + වගකීම්

- 18 000 = - 18 000

ඉහත බලපෑම සිදුකරන ගනුදෙනුව තෝරන්න.

(i) වැටුප් ගෙවීම රු. 18 000

(ii) බැංකු ණය ගෙවීම රු. 18 000

(iii) ලී බඩු උපකරණ මිලදී ගැනීම රු. 18 000

(iv) ණයහිමියන්ට ගෙවීම රු. 18 000

30. නිවැරදි ද්විත්ව සටහන් මූලධර්මය වන්නේ,

(i) වියදම් අඩුවීම හර
වියදම් වැඩිවීම බැර

(ii) වගකීම් අඩුවීම හර
වගකීම් වැඩිවීම බැර

(iii) හිමිකම් වැඩිවීම හර
හිමිකම් අඩුවීම බැර

(iv) ආදායම් වැඩිවීම හර
ආදායම් අඩුවීම බැර

31. තරුෂිගේ ව්‍යාපාරයේ කොමිස් ආදායම රු. 5000 කි. ලද කොමිස් ගිණුම,

(i) වගකීම් ගිණුමකි. (ii) වත්කම් ගිණුමකි. (iii) වියදම් ගිණුමකි. (iv) ආදායම් ගිණුමකි.

32. වත්කම් ගිණුම් පමණක් ඇතුළත් කාණ්ඩය වනුයේ,

(i) ගොඩනැගිලි ගිණුම , කොමිස් ආදායම් ගිණුම , බැංකු ණය ගිණුම

(ii) තොග ගිණුම , ලී බඩු ගිණුම , ණයගැති ගිණුම

(iii) වැටුප් ගිණුම , ණයහිමි ගිණුම , ඉඩම් ගිණුම

(iv) බැංකු ණය ගිණුම , ණයගැති ගිණුම , ලී බඩු ගිණුම

33. කසුන්ගේ ව්‍යාපාරයේ ස්ථාවර තැන්පත් පොලී ආදායම් රු. 25 000 කි. ඊට අදාල නිවැරදි ද්විත්ව සටහන වනුයේ,

(i) ස්ථාවර තැන්පතු පොලී ආදායම් ගිණුම හර
මුදල් ගිණුම බැර

(ii) ස්ථාවර තැන්පතු ගිණුම හර
ස්ථාවර තැන්පතු පොලී ආදායම් ගිණුම බැර

(iii) ස්ථාවර තැන්පතු පොලී ආදායම් ගිණුම හර
බැංකු ණය ගිණුම බැර

(iv) මුදල් ගිණුම හර
ස්ථාවර තැන්පත් පොලී ආදායම් ගිණුම බැර

34. ව්‍යාපාරයක දැකිය හැකි ගිණුම් සියල්ලෙහිම එකතුව හඳුන්වනු ලබන්නේ,

(i) ශේෂ පිරික්සුම ලෙසය. (ii) ලෙජරය ලෙසය.
(iii) මුදල් පොත ලෙසය. (iv) ලෙජර් ගිණුම ලෙසය.

35. විකුණුම් ජ'නලයේ ගනුදෙනු සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛනය වන්නේ,

(i) ලදුපත (ii) වවුචරය (iv) ජ'නල් වවුචරය (iv) ඉන්වොයිසිය

36. මූලික පොතක් මෙන්ම ලෙජර් ගිණුමක් ලෙස ද්විත්ව කාර්යක් කරනු ලබන්නේ,

(i) විකුණුම් ජ'නලය යි. (i) මුදල් පොත යි. (iii) ගැනුම් ජ'නලය යි. (iv) පොදු ජ'නලය යි.

37. ව්‍යාපාරයක් විසින් මුදල් පොතේ පමණක් සටහන් කරන ගනුදෙනු ඇතුළත් පිළිතුර වන්නේ,

(i) කොමිස් ආදායම් ලැබීම් , අත්පිට ගැනුම් , ලී බඩු මිලදී ගැනීම්
(ii) ණයහිමි ගෙවීම් , කොමිස් ආදායම් ලැබීම් , වෙළඳ භාණ්ඩ ණයට ගැනුම්
(iii) ගොඩනැගිලි කුලී ගෙවීම් , අත්පිට විකුණුම් , ගෙවිය යුතු විදුලිය
(iv) ලී බඩු ණයට ගැනීම් , ණයගැති ලැබීම් , කොමිස් ආදායම් ලැබීම්

38. ව්‍යාපාරයක බැංකු ගිණුමේ බැර ශේෂයක් දක්නට ලැබීමේ දී එයින් පෙන්නුම් කරන්නේ,

(i) බැංකු අයිරාවක් ඇති බවය.
(ii) බැංකු ණය ගෙවා ඇති බවය.
(iii) සෘජු ප්‍රේෂණ ලැබී ඇති බවය.
(iv) ස්ථාවර නියෝග මත වියදම් ගෙවා ඇති බවය.

39. කවිංසාගේ ව්‍යාපාරයේ විකුණුම් වලින් ලැබුණු රු. 70 000 ක චෙක්පත එම අවස්ථාවේදී බැංකුවේ තැන්පත් කළ විට ද්විත්ව සටහන වනුයේ,

(i) විකුණුම් ගිණුම හර
බැංකු ණය ගිණුම බැර

(ii) බැංකු ගිණුම හර
විකුණුම් ගිණුම බැර

(iii) මුදල් ගිණුම හර
විකුණුම් ගිණුම බැර

(iv) විකුණුම් ගිණුම හර
මුදල් ගිණුම බැර

40. අමල් නැමැති ණයගැතියාගෙන් ලැබී බැංකුවේ තැන්පත් කළ චෙක්පතක් අගරු වූ බව බැංකුව දැනුම් දෙන ලදි. ඊට අදාල ද්විත්ව සටහන වනුයේ,

(i) ණයගැති ගිණුම හර
මුදල් ගිණුම බැර

(ii) බැංකු ගිණුම හර
ණයගැති ගිණුම බැර

(iii) ණයගැති ගිණුම හර
බැංකු ගිණුම බැර

(iv) මුදල් ගිණුම හර
ණයගැති ගිණුම බැර

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

## 10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

වැදගත් :

- පළමු ප්‍රශ්ණයටත් I කොටසින් ප්‍රශ්න දෙකක්ද,II කොටසින් ප්‍රශ්න දෙකක්ද බැගින් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

උසස් පෙළ අධ්‍යාපන කටයුතුවල නිරතවීමෙන් අනතුරුව විදේශගත වූ අරුණ ප්‍රියලාල් නැවත ශ්‍රී ලංකාවට පැමිණියේ රු. 1000 000 ක් අතැතිවය. එම මුදල් සහ තමා සතු රු. 3 500 000 ක් වටිනා තම වාහනය යොදා ගෙන ප්‍රවාහන සේවාවක් ඇරඹීමට අදහසක් කළේය. ඒ අනුව ඔහු " අරුණ ට්‍රැවල්ස් " නමින් ව්‍යාපාරය ආරම්භ කර ලියාපදිංචි කරන ලදී. තම නිවසේ කාර්යාලය පවත්වා ගෙන යන ඔහු රු. 30 000 ක වැටුපකට තම මිතුරා වූ කනිෂ්ක කළමණාකරු ලෙස පත් කර ගන්නා ලදී. ඔහු වාහන පිළිබඳ හොඳ දැනුමක් ඇති අයෙකු විය.

2018 - 01 - 01 සිට 2018 - 01 - 08 දක්වා පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු මෙසේය.

(1) රු. 800 000 ක් තැන්පත් කර බැංකු ජංගම ගිණුමක් ආරම්භ කරන ලදි.

(2) ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම රු. 25 000

(3) රු. 200 000 ක බැංකු ණයක් ලබා ගැනීම

(4) වාහන අලුත්වැඩියාව රු. 125 000

(5) පෞද්ගලික ආයතන වලට වාහන සැපයීමෙන් ලද ආදායම රු. 300 000

(6) ඉන්ධන වියදම් රු. 150 000 වැය වී අතර අරුණ ප්‍රියලාල් තම පෞද්ගලික වාහනය සඳහා රු. 15 000 ක ඉන්ධන වැය කර ඇත.

(1) (i) ඉහත සිද්ධියේ සඳහන් වන ව්‍යාපාර සංවිධානය කුමක් ද?

(ii) එම සංවිධානයේ දක්නට ලැබෙන වාසියක් ලියන්න.

(2) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තීන් දෙකක් ලියන්න.

(3) නිෂ්පාදන සාධක වන ශ්‍රමය, ව්‍යවසාය යන සාධක දෙක සඳහා ඉහත සිද්ධියෙන් උදාහරණ දෙකක් ඉදිරිපත් කරන්න.

(4) ඉහත ව්‍යාපාරය ලියාපදිංචි කර ඇත. ව්‍යාපාර ලියාපදිංචියෙන් අත් කර ගත හැකි වාසි දෙකක් ලියන්න.

(5) " අරුණ ට්‍රැවල්ස්" ව්‍යාපාරයේ ආරම්භක (2018 - 01 - 01 දිනට) හිමිකම ගණනය කරන්න.

(6) ඉහත සඳහන් ව්‍යාපාරයේ 2018 - 01 - 08 දිනට මුදල් ශේෂය ගණනය කර දක්වන්න.

(7) මුදල් පොත පිළියෙළ කිරීමේ දී භාවිතා වන මූලාශ්‍ර ලේඛන දෙකක් සඳහන් කරන්න.

(8) ඉහත ව්‍යාපාරයේ දක්නට ලැබෙන,

(i) ජංගම නොවන වත්කමක් ලියන්න.

(ii) ජංගම නොවන වත්කමක දක්නට ලැබෙන ලක්ෂණයක් ලියන්න.

(9) (i) මෙම ව්‍යාපාරයේ වත්කම් වැඩිවීම හා වගකීම් වැඩිවීමට අදාල ගණුදෙනුවක් ලියන්න.

(ii) මෙම ව්‍යාපාරයේ ප්‍රධානතම ආදායම වන්නේ කුමක් ද?

(10) (i) ඉහත ව්‍යාපාරයේ හිමිකම වෙනස්වන අවස්ථාවක් ලියා දක්වන්න.

(ii) එම අවස්ථාවට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න. (2 x 10 = 20)

# I - කොටස - ව්‍යාපාර අධ්‍යයනය

02. උපතේ සිට මරණය දක්වා මිනිසාට නොයෙකුත් භාණ්ඩ හා සේවා අවශ්‍ය වේ.

(i) (අ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් යන්න නිර්වචනය කරන්න.

(ආ) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර දෙකක් නම් කරන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නැංවීම ව්‍යාපාරවල ප්‍රධාන අරමුණු දෙකෙන් එකකි. ( )

(ආ) සිල්ලර වෙළඳ ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් නොවේ. ( )

(ඉ) යන්ත්‍ර සූත්‍ර ගොඩනැගිලි යනාදිය භූමිය නැමැති නිෂ්පාදන සාධකයට අයත් වේ. ( )

(ඊ) ව්‍යාපාර සඳහා හිතකර විවිධ දිරිගැන්වීම් ලබා දෙමින් රජය ව්‍යාපාර කෙරෙහි දායකත්වය දක්වයි. ( )

(ල.02)

(iii) සඳසිරිගම ප්‍රදේශයේ ජීවත් වන සපුමලි දක්ෂ මැහුම් ශිල්පිනියකි. ඇය ප්‍රදේශයේ පාසල් දරුවන් සඳහා නිල ඇඳුම් මසා සාදාරණ මිලට අලෙවි කරයි.

(අ) සපුමල් විසින් සපුරාලන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද?

(ආ) සපුමලී ඇඳුම් මැසීම සඳහා භාවිතා කරන මහණ මැෂිම කුමන නිෂ්පාදන සාධකයට අයත් ද? (ල.02)

(iv) පාසල් අධ්‍යාපනය අවසන් කර සිටින සුපුන් නයනජිත්, පාසල ආසන්නයේ " S and N බුක් ෂොප්" නමින් පොත් හලක් පවත්වාගෙන යයි.

(අ) " S and N බුක් ෂොප්" හි ඇල්මැති පාර්ශව දෙකක් ලියන්න.

(ආ) ඉහත දක්වන ලද එක් ඇල්මැති පාර්ශවයක අරමුණු දෙකක් ලියන්න. (ල.02)

(මුළු ලකුණු 08)

03. (i) ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාමට නම් ව්‍යාපාර පරිසරය පිළබඳ නිරන්තරයෙන් අවධානය යොමු කර සිටීම වැදගත් ය.

(අ) ව්‍යාපාර පරිසරය කොටස් දෙකකින් යුක්ත අතර ඉන් අභ්‍යන්තර පරිසරය යනු කුමක් ද?

(ආ) ව්‍යාපාර අභ්‍යන්තර පරිසර සාධක 02 ක් ලියන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයක සැපයුම්කරුවෝ අභ්‍යන්තර පරිසර සාධකයකි. ( )

(ආ) තම දක්ෂතාව හා හැකියාව මත පවරන කාර්යය නිසි පරිදි ඉටු කරන පුද්ගලයෝ කළමණාකරුවෝය. ( )

(ඉ) අතීතයේ භාවිතා කළ සාමාන්‍ය තැපැල වෙනුවට විද්‍යුත් තැපැල භාවිත කිරීම තාක්ෂණික පරිසරයට අයත් ය. ( )

(ඊ) රුසියාවේ භාවිතා වන මුදල් වර්ගය රුපියල් නමින් හඳුන්වයි. ( )

(ල.02)

(iii) නිස්කලංක පරිසරයක ජීවත් වන ප්‍රතිභා මහත්මිය විශ්‍රාමික දක්ෂ සංගීත ගුරුවරියකි. ඇය " ප්‍රභා කලායතනය" නමින් කලායතනයක් තම නිවසේ පවත්වාගෙන යන්නීය.

(අ) ඉහත සිද්ධියේ සඳහන් ශක්තියක් හා දුර්වලතාවයක් ලියන්න.

(ආ) ව්‍යාපාර අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ ඇයිදැයි කරුණු දෙකක් ඉදිරිපත් කරන්න. (ල.02)

(iv) (අ) ව්‍යාපාර නෛතික පරිසරය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ආ) නෛතික පරිසරයට අදාළ අණපනතක් එකක් ලියන්න. (ල.02)

(මුළු ලකුණු 08)

04. පියුම් හා නයෝමි තමන් ඉතිරි කරගත් රු. 300 000 බැගින් වූ රු. 600 000 ක් මුදල් යොදවා ගමන් මලු නිෂ්පාදනය කොට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් කරගෙන යයි.

(i) (අ) ඉහත ව්‍යාපාරය හිමිකාරිත්වය අනුව පෞද්ගලික අංශයේ කුමන ව්‍යාපාර වර්ගයට අයත් ද?

(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි දෙකක් ලියන්න. (ල.02)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සමූපකාර සමිති පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි.

(ආ) ඒක පුද්ගල ව්‍යාපාරයක නම ලියා පදිංචි කිරීමෙන් නීතිමය පුද්ගලභාවයක් ලැබේ.

(ඉ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය රාජ්‍ය සංස්ථාවකි.

(ඊ) සංස්ථාපිත සමාගම් වල කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය රැස්කර ගත හැකිය. (ල.02)

(iii) (අ) සංස්ථාපිත සමාගමක් යනු කුමක් ද?

(ආ) සංස්ථාපිත සමාගම් වල වාසි දෙකක් ලියන්න. (ල.02)

(iv) සමන් එළිය ප්‍රදේශයේ ජීවත් වන සචින්ත හර්ෂණ විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඔහු තම ව්‍යාපාරය " සචී ඉලෙක්ට්‍රික්ස්" නමින් පවත්වාගෙන යයි.

(අ) සචී ඉලෙක්ට්‍රික්ස් ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද?

(ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල.02)

(මුළු ලකුණු 08)

## II - කොටස - ගිණුම්කරණය

05. (i) (අ) වියදම් යන්න නිර්වචනය කරන්න. (ල. 01)

(ආ) වගකීමක ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 01)

(ii) පහත සඳහන් එක් එක් ගනුදෙනුව මගින් හිමිකමට කරනු ලබන බලපෑම "වැඩි වේ." , "අඩු වේ", "වෙනස් නොවේ" යනුවෙන් දක්වන්න.

(අ) ව්‍යාපාරයට රු. 40 000/- ක බැංකු ණයක් ගැනීම

(ආ) අයිතිකරුගේ නිවසේ විදුලි බිල රු. 1500/- ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවීම.

(ඇ) ණයගැති මුදල් රු. 5 000/- ක් ලැබීම.

(ඈ) රු. 8,000/- ක භාණ්ඩ රු. 10,000/- කට අත්පිට මුදලට විකිණීම (ල. 02)

(iii) (අ) පහත සඳහන් ගිණුම් අයත් වන ගිණුම් වර්ගය සඳහන් කරන්න

| | | | |
|---|---|---|---|
| (1) | මුදල් ගිණුම | (2) | ගැනුම් ගිණුම |
| (3) | වැටුප් ගිණුම | (4) | ණයගැති ගිණුම |

(ල. 02)

(ආ) සමීරගේ ව්‍යාපාරයේ 2017 වර්ෂය සඳහා පහත තොරතුරු දී ඇත.

| | |
|---|---|
| ප්‍රාග්ධනය (2017 - 01 - 01 දිනට) | 250 000 |
| වර්ෂයේ ආදායම | 135 000 |
| වර්ෂයේ වියදම් | 108 000 |
| වර්ෂය තුල අයිතිකරු යෙදූ මුදල් | 75 000 |

අවශ්‍ය වන්නේ,

2017 - 12 - 31 දිනට අයිතිකරුගේ හිමිකම් ගණනය කිරීම. (ල. 02)

(iv) රොෂ්නි ගේ ව්‍යාපාරයේ 2018 මැයි 01 දිනට පහත ශේෂයන් දක්නට ලැබුණි.

| | |
|---|---|
| ලී බඩු උපකරණ | රු. 200 000 |
| තොගය | රු. 100 000 |
| මුදල් | රු. 50 000 |

| | |
|---|---|
| බැංකු ණය | රු. 50 000 |
| ණය හිමියෝ | රු. 100 000 |
| ප්‍රාග්ධනය | රු. 200 000 |

මැයි මාසයේ පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදු වී ඇත.

1. රු. 50 000 ක භාණ්ඩ තොගයක් ණයට ගැනීම
2. රු. 1000 ක පොලී ඇතුළත්ව බැංකු ණය වාරිකය රු. 5000/- ක් ගෙවීම
3. රු. 50 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 75 000 කට අත්පිට මුදලට විකිණීම

අවශ්‍ය වන්නේ,

ඉහත එක් එක් ගණුදෙනුව පහත ගිණුම්කරන සමීකරණයට බලපාන ආකාරය දැක්වීම

| | ලී බඩු උපකරණ | + තොගය | + මුදල් | = බැංකුණය | +ණය හිමියෝ | + ප්‍රාග්ධනය |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |

(ල.04)
(මුළු ලකුණු 12)

06. (i) (අ) ගනුදෙනුවක ද්විත්ව බලපෑම යන්න පැහැදිලි කරන්න.
(ආ) වත්කම් සම්බන්ධයෙන් ද්විත්ව සටහන් මූල ධර්මය ලියා දක්වන්න. (ල. 02)

(ii) (අ) ගිණුමක් යනු කුමක් ද?
(ආ) ලෙජරයක තිබිය හැකි ගිණුම් වර්ග පහ දක්වන්න. (ල. 02)

(iii) පහත ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියා දක්වන්න.
(අ) රු. 10 000 ක් අයිතිකරුගේ පෞද්ගලික පරිහරණයට ගැනීම
(ආ) රු. 2000 ක් මාසික විදුලි බිල ගෙවීම
(ඇ) රු. 60 000 ක් භාණ්ඩ ණයට විකිණීම
(ඈ) රු. 50 000 ක් පොලි ආදායම් ලැබීම (ල.04)

(iv) තිසුරිගේ ව්‍යාපාරයේ 2018 මැයි මස සිදු වූ ගනුදෙනු ඇතුලත් මුදල් ගිණුම පහත දැක්වේ.

මුදල් ගිණුම

| දිනය | විස්තරය | සු පි | වටිනාකම | දිනය | විස්තරය | සු පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| 2018-05-01 | ප්‍රාග්ධන ගිණුම | | 100 000 | 2018-05-02 | ගැණුම් ගිණුම | | 10 000 |
| 05-10 | විකුණුම් ගිණුම | | 25 000 | 05-06 | බැංකු ණය පොළී | | 2 000 |
| 05-15 | ණයගැති ගිණුම | | 12 000 | 05-20 | උපකරණ ගිණුම | | 8 000 |
| 05-28 | කොමිස් ආදායම් | | 5 000 | 05-25 | ණයහිමි ගිණුම | | 5 000 |
| | | | | 05-31 | ශේෂය ප /ගෙ | | 117 000 |
| | | | 142 000 | | | | 142 000 |
| 06-01 | ශේෂය ඉ/ගෙ | | 117 000 | | | | |

අවශ්‍ය වන්නේ,

ඉහත මුදල් ගිණුමේ සටහන් කරන ලද ගනුදෙනු වලට අදාළ අනෙක් සටහන් තිසුරිගේ ව්‍යාපාරයේ ලෙජරයේ පිටපත් කර ඇති ආකාරය දැක්වීම. (ල. 04)

(මුළු ලකුණු 12)

07. (i) (අ) මුදල් වට්ටම් යනු මොනවාද ?

(ආ) ලද වට්ටම් ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න. (ල. 02)

(ii) පහත සඳහන් වගුවේ හිස්තැන් පුරවන්න.

| | ගණුදෙනුවේ ස්වාභාවය | මූලාශ්‍ර ලේඛණය | මූලික පොත |
|---|---|---|---|
| (අ) | වෙළඳ භාණ්ඩ ණයට ගැනීම් | ........................ | ........................ |
| (ආ) | ........................ | සුළු මුදල් වවුචරය | ........................ |

(ල. 02)

(iii) (අ) සුළු මුදල් අග්‍රිමය යනු කුමක් ද? (ල. 02)

(ආ) සීමිත අනුහස් සමාගමේ 2018 මැයි 01 දින සුළු මුදල් භාරකරු අත ඉතිරිව තිබූ මුදල රු. 460/- ක් විය. මැයි මාසය තුළ ඔහු විසින් ගෙවීම් කරන ලද සුළු මුදල් වවුචර් වල එකතුව රු. 1040 ක් විය.

(1) සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම කොපමණ ද?

(2) 2018 - 05 - 31 දින ප්‍රධාන මුදල් භාරකරු විසින් ප්‍රතිපූර්ණය කරන ලද මුදල කොපමණ ද? (ල. 02)

(iv) රන්දිමගේ ව්‍යාපාරයේ 2018 - 05 - 01 දිනට පැවති ශේෂයන් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| මුදල් | රු. 65 000 | ප්‍රාග්ධනය | රු. 100 000 |
| ණයගැතියෝ | | ණයහිමියෝ | |
| බිමල් | රු. 30 000 | විශාලා | රු. 20 000 |
| රනිල් | රු. 25 000 | කමණි | රු. 35 000 |

මැයි මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ

05 - 03 අත්පිට විකුණුම් රු. 25 000

05 - 05 විදුලි බිල ගෙව්වා රු. 750

05 - 10 විශාලාගේ සම්පූර්ණ ණය ගිණුම පියවීම සඳහා රු. 19 000/- ක් ගෙව්වා ලද වට්ටම රු. 1000 කි.

05 - 16 අත්පිට ගැනුම් රු. 15 000

05-20 රනිල්ගේ මුළු ණය මුදල පියවීම සඳහා මුදල් ලැබුණා දුන් වට්ටම 5 %

05 - 25 බිමල්ගේ රු. 10 000 ක ණය පියවීමේ දී රු. 500 ක වට්ටමක් දෙන ලදී

05 - 08 කමණිගේ ණය මුදලින් රු. 20 000 ක් පියෙව්වා ලද වට්ටම 5 %

05 - 30 බැංකුවේ මුදල් තැන්පත් කලා රු. 10 000 /- යි.

අවශ්‍ය වන්නේ,

රන්දිමගේ ව්‍යාපාරයේ 2018 මැයි මාසයේ මුදල් ගිණුම (ල. 04)

(මුළු ලකුණු 12)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 - ( i ) | 2 - (iii) | 3 - ( ii ) | 4 - ( ii ) | 5 - (iv) | 6 - (iii) | 7 - ( ii ) | 8 - (iii) | 9 - (iv) | 10 - (iv) |
| 11 - ( i ) | 12 - (iv) | 13 - ( i ) | 14 - (iv) | 15 - (iii) | 16 - ( ii ) | 17 - (iv) | 18 - ( ii ) | 19 - ( ii ) | 20 - (iii) |
| 21 - ( iv) | 22 - ( ii ) | 23 - ( ii ) | 24 - (iii) | 25 - ( i ) | 26 - (iii) | 27 - (iv) | 28 - ( ii ) | 29 - ( i ) | 30 - ( ii ) |
| 31 - ( iv) | 32 - ( ii ) | 33 - (iv) | 34 - ( ii ) | 35 - (iv) | 36 - ( ii ) | 37 - ( i ) | 38 - ( i ) | 39 - ( ii ) | 40 - (iii) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II පත්‍රය - I කොටස**

01. (1) (i) කේවලස්වාමි / තනි පුද්ගල / ඒක පුද්ගල ව්‍යාපාරයක්.

(ii) ලාභය තනිව භුක්තිවිඳීම
ස්වාධීන තීරණ ගත හැකිවීම
ආරම්භය පහසුවීම

(2) ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම. / හොඳ මූල්‍ය ශක්තියක් තිබීම. සේවකයාගේ විශේෂිත දැනුම.

(3) ශ්‍රමය - කණිෂ්ක කළමනාකරු ලෙස සේවය කිරීම
ව්‍යවසාය - ව්‍යාපාර අවදානම් දරමින් අරුණ ශාන්ත ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාම

(4) අනන්‍යතාවක් ලැබීම
ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම
ණය ලබා ගැනීමේ දී පහසුවක් ලැබීම
රජයෙන් ලබා දෙන දිරි ගැන්වීම් ලබා ගැනීමට සුදුසු කමක් වීම

(5)

| | | |
|---|---|---|
| මුදල් | රු. | 1 000 000 |
| වාහනය | රු. | 3 500 000 |
| හිමිකම | රු. | 4 500 000 |

(6)

| | | | |
|---|---|---|---|
| | ප්‍රාග්ධනය යෙදීම | රු. | 1 000 000 |
| | බැංකු ණය ලබා ගැනීම | රු. | 2 00 000 |
| | සේවා ආදායම | රු. | 3 00 000 |
| | මුළු ලැබීම | රු. | 1 500 000 |
| ( - ) | බැංකු ගිණුමක් ආරම්භ කිරිම | (රු. | 800 000) |
| | ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම | (රු. | 25 000) |
| | වාහන අලුත් වැඩියාව | (රු. | 125 000) |
| | ඉන්ධන | (රු. | 150 000) |
| | ගැනිලි | (රු. | 15 000) |
| | 2018 - 01 - 08 දිනට මුදල් ශේෂය | රු. | 385 000 |

හෝ

මුදල් ගිණුම

| දිනය | ලදුපත් අංකය | විස්තරය | සු පි | වටිනාකම | දිනය | ගෙවීම් වවුචරය | විස්තරය | සු පි | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01/01 | | ප්‍රාග්ධන ගිණුම | | 1 000 000 | 01/01 | | බැංකු ගිණුම | | 800 000 |
| 01/03 | | බැංකු ණය | | 200 000 | 01/02 | | ලිපිද්‍රව්‍ය | | 25 000 |
| 01/05 | | සේවා ආදායම | | 300 000 | 01/04 | | වාහන අලුත්වැඩියා | | 125 000 |
| | | | | | 01/06 | | ඉන්ධන | | 150 000 |
| | | | | | 01/06 | | ගැනිලි | | 15 000 |
| | | | | | 01/08 | | ශේෂය ප /ගෙ | | 385 000 |
| | | | | 1 500 000 | | | | | 1 500 000 |
| 01/08 | | ශේෂය ඉ/ගෙ | | 385 000 | | | | | |

(නිවැරදි අයිතම 4 ට 1/2 බැගින් 8 ට ලකුණු 01 මුදල් ශේෂයට 01)

(7) ලදුපත හා ගෙවීම් වවුචරය

(8) (i) වාහන

(ii) ව්‍යාපාරයේ දිගුකල් ප්‍රයෝජනය සඳහා මිලදී ගැනීම

(9) (i) බැංකු ණයයක් ලබා ගැනීම

(ii) ප්‍රවාහන සේවා සැපයීමෙන් ලබන ආදායම

(10) (i) අයිතිකරුගේ ගැනිලි / ප්‍රාග්ධනය ලෙස මෝටර් රථය යෙදවීම

(ii) ගැනිලි ගිණුම හර 15 000

මුදල් ගිණුම බැර 15 000 (ල. 2 x 10 = 20)

## I කොටස

02. (i) (අ) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා ස්පර්ශ කළ හැකි භෞතික පැවැත්මක් ඇති දෑ නිපදවන ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර වේ.

(ආ) තොග වෙළඳ ආයතන / සිල්ලර වෙළඳ ආයතන / රක්ෂණ ආයතන / බැංකු / රූපලාවන්‍ය ආයතන / අධ්‍යාපන ආයතන

(ii) (අ) අසත්‍යයයි (ආ) සත්‍යයයි (ඉ) අසත්‍යයයි (ඊ) සත්‍යයයි

(iii) (අ) ඇදුම් (ආ) ප්‍රාග්ධනයට

(iv) (අ) පාසල් සිසුන්, අයිතිකරු / සුපුන් / සුපුන් නයනජිත් සපැයුම්කරුවන්, පාසල් ගුරුවරුන් ......

(ආ) අයිතිකරු - ආයෝජනයේ සුරක්ෂිතබව ● ප්‍රමාණවත් ලාභයක් ලැබීම ● ව්‍යාපාරයේ අනාගත වර්ධනය

ගනුදෙනුකරුවෝ (පාසල් සිසුන්, පාසල් ගුරුවරුන්) - නිෂ්පාදිත සාධාරණ මිලට ලබා ගැනිම ● ගුණාත්මක නිෂ්පාදිත ලබා ගැනීම

සැපයුම්කරුවෝ - අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම ● නිසි පරිදි මුදල් ලබා ගැනීම

(ලකුණු 2 x 4 = 08)

03. (i) (අ) ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වයට බලපාන, ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක වන විවිධ පාර්ශව සහ ව්‍යාපාරය තුල පවතින අනෙකුත් සාධක අභ්‍යන්තර පරිසරය නම් වේ.

(ආ) අයිතිකරුවෝ, කළමණාකරුවෝ, සේවකයෝ

(ii) (අ) අසත්‍යයයි (ආ) අසත්‍යයයි (ඉ) සත්‍යයයි (ඊ) අසත්‍යයයි

(iii) (අ) ශක්තියක් : දක්ෂ සංගිත ගුරුවරියක් අවස්ථාවක් : නිස්කලංක පරිසරය

(ආ) ව්‍යාපාරයේ ශක්තීන් හඳුනාගෙන ඒවා ව්‍යාපාරයට යොදා ගැනීම / ව්‍යාපාරයේ දුර්වලතා හඳුනාගෙන දුර්වලතා මග හැරවීමට කටයුතු කිරීම.

(iv) (අ) පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා දේශීය නිෂ්පාදකයන් හා ව්‍යාපාරික ප්‍රජාව ආරක්ෂා කිරීම සඳහාත් පරිසරය ආරක්ෂා කිරීම සඳහාත් සම්මත අණපනත් හා නීතිරීති නෛතික පරිසරය වේ.

(ආ) ● 2007 අංක 07 දරණ සමාගම් පනත ● 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත ● 1954 අංක 14 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත

(ලකුණු 2 x 4 = 08)

04. (i) (අ) හවුල් ව්‍යාපාර

(ආ) ⋆ පහසුවෙන් ඇරඹිය හැකි වීම ⋆ වැඩි ප්‍රාග්ධනයක් රැස්කරගත හැකිය. ⋆ හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම. ⋆ වගකීම බෙදීයාම ⋆ සාමූහික තීරණ ගත හැකි වීම.

(ii) (අ) සත්‍යයයි (ආ) අසත්‍යයයි (ඉ) සත්‍යයයි (ඊ) සත්‍යයයි

(iii) (අ) 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතු, නෛතික පුද්ගලභාවයක් සහිත කොටස් නිකුතුවෙන් ප්‍රාග්ධනය සපයා ගත හැකි කොටස් හිමියන්ගේ වගකීම සීමිත වන්න වූ ව්‍යාපාර සංස්ථාපිත සමාගම් වේ.

(ආ) ● වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකිය. ● නෛතික පුද්ගල භාවයක් හිමි වේ. ● අඛණ්ඩ පැවැත්මක් තිබේ. ● වගකීම සීමා සහිත වේ. ● අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමණාකරණය වීම.

(iv) (අ) ඔව් (ආ) අයිතිකරු වන සචින්ත හර්ෂණ ඔහුගේ සම්පූර්ණ නමින් නොව සචි ඉලෙක්ට්‍රික්ස් නමින් පවත්වාගෙන යන නිසා ලියාපදිංචි කළ යුතුය.

(ලකුණු 2 x 4 = 08)

## II - කොටස

05. (i) (අ) ගැනිලි නිසා සිදුවන හිමිකමෙහි අඩුවීම හැරුණු විට හිමිකමෙහි සිදුවන අඩුවීම වියදම් ලෙස හැඳින් වේ. (ල. 01)

(ආ) ● අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම ● බේරුම් කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම ● වර්තමාන බැඳීමක් තිබීම. (නිවැරදි කරුණු තුනකට ල. 01)

(ii) (අ) වෙනස් නොවේ (ආ) අඩුවේ (ඇ) වෙනස් නොවේ (ඈ) වැඩි වේ (ල. 02)

(iii) (අ) 1. වත්කම් 2. වියදම් 3. වියදම් 4. වත්කම් (ල. 02)

(ආ)

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය (2017 / 01 / 01 දිනට) | 250 000 | |
| + ආදායම් | 135 000 | |
| අතිරේක ප්‍රාග්ධනය | 75 000 | |
| | 460 000 | ⟵ (ල. 01) |
| - වියදම් | 108 000 | |
| හිමිකම (2018/12/03) | 352 000 | ⟵ (ල. 01) |

(iv)

| ලී බඩු | තොගය | මුදල් | = | බැංකු | ණයහිමියෝ | ප්‍රාග්ධනය | |
|---|---|---|---|---|---|---|---|
| 200 000 | + 100 000 | + 50 000 | = | ණය 50 000 | + 100 000 | + 800 000 | (ල. 01) |
| | + 50 000 | | | | + 50 000 | | (ල. 01) |
| | | ( 5 000) | = | (4 000) | | (1 000) | (ල. 01) |
| | ( 5 000) | + 75 000 | = | | | + 25 000 | (ල. 01) |

(ලකුණු 12)

06. (i) (අ) ව්‍යාපාරයක සිදුවන සෑම ගනුදෙනුවකම ප්‍රතිඵලයක් වශයෙන් ගිණුම්කරණ සමීකරණයේ අයිතම දෙකකට බලපායි. එය ගනුදෙනුවක ද්විත්ව බලපෑම ලෙස හඳුනා ගැනේ. (ල.01)

(ආ) වත්කම් වැඩි වීම හර

වත්කම් අඩු වීම බැර (ල. 01)

(ii) (අ) කාලච්ඡේදයක් තුළ වත්කමක, හිමිකමක, වගකීමක, ආදායමක, හෝ වියදමක සිදුවන වෙනස්වීම (අඩු වීම හෝ වැඩි වීම) වාර්තා කරනු ලබන පොදුවේ පිළිගත් ආකෘතිය ගිණුමක් වේ. (ල. 01)

(ආ)වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් (ල. 01)

(iii) (අ) ගැනිලි ගිණුම හර 10 000

මුදල් ගිණුම බැර 10 000

(ආ) විදුලි වියදම් හර 2 000

මුදල් ගිණුම් බැර 2 000

(ඇ) ණයගැතියෝ හර 60 000

විකුණුම් ගිණුම බැර 60 000

(ඈ) මුදල් ගිණුම හර 50 000

පොලී ආදායම් 50 000

( නිවැරදි ද්විත්ව සටහනට වටිනාකම් සහිතව ල. 01 බැගින්) (ල. 04)

(iv)

ප්‍රාග්ධන ගිණුම

| | |
|---|---|
| | 05/01 මුදල් 100 000 (1/2) |

ගැනුම් ගිණුම

| | |
|---|---|
| 05/02 මුදල් 10 000 (1/2) | |

විකුණුම් ගිණුම

| | |
|---|---|
| | 05/10 මුදල් 25 000 (1/2) |

බැංකු ණය පොලී ගිණුම

| | |
|---|---|
| 05/06 මුදල් 10 000 (1/2) | |

ණයගැති ගිණුම

| | |
|---|---|
| | 05/05 මුදල් 12 000 (1/2) |

උපකරණ ගිණුම

| | |
|---|---|
| 05/20 උපකරන 8 000 (1/2) | |

කොමිස් ආදායම්

| | |
|---|---|
| | 05/28 මුදල් 5 000 (1/2) |

ණය හිමි ගිණුම

| | |
|---|---|
| 05/25 මුදල් 5 000 (1/2) | |

(නිවැරදි එක් ගිණුම් ආකෘතියක් වත් තිබිය යුතුයි. නොමැති නම් ලකුණු 1 /2 ක් අඩු කරන්න. (ල. 04)

(ලකුණු 12)

07. (i) (අ) ව්‍යාපාරයක ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේදී හා ණයහිමියන්ට මුදල් ගෙවීමේ දී පියවිය යුතු ණය වටිනාකමින් කෙරෙන අඩු කිරීම මුදල් වට්ටම් වේ. (ල. 01)

(ආ) ණයහිමි ගිණුම හර

ලද වට්ටම් බැර (ල. 01)

(ii) (අ) ගැනුම් ඉන්වොයිසිය ගැනුම් ජ'නලය (ල. 01)

(ආ) සුළු මුදල් වියදම් සුළු මුදල් පොත (ල. 01)

(iii) (අ) සුළු මුදල් ගෙවීම් සඳහා ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරු වෙත ලබා දෙන නිශ්චිත මුදල (ල. 02)

(ආ) 1. රු. 1500/- (ල. 01)

2. රු. 1040/- (ල. 01)

(iv) **මුදල් ගිණුම**

| | | වට්ටම් | මුදල් | | | වට්ටම් | මුදල් |
|---|---|---|---|---|---|---|---|
| 05/01 | ශේෂය ඉ/ගෙ | | 65 000 | 05/05 | විදුලි බිල් | | 750 |
| 05/03 | විකුණුම් | | 25 000 | 05/10 | විශාලා | 1060 | (1/2) 19 000 |
| 05/20 | රනිල් (1/2) | 1250 | 23 750 | 05/16 | ගැනුම් | | 15 000 |
| 05/25 | බිමල් (1/2) | 500 | 9 500 | 05/28 | කමණි | 1000 | (1/2) 19 000 |
| | | | | 05/30 | බැංකු | | 10 000 |
| | | | | 05/31 | ශේෂය ප/ගෙ | | 59 500 |
| | | 1750 | 123 250 | | | 2000 | 123 250 |
| 06/01 | ශේෂය ඉ/ගෙ | | 59 500 | | | | |

(අනෙක් නිවැරදි ගනුදෙනු 3 කට 1/2 බැගින් උපරිම 01 යි)
නිවැරදි ගිණුම් ආකෘතිය නොමැති නම් ලකුණු 1/2 ක් අඩු කරන්න. (ලකුණු 04)

(ලකුණු 12)